# ශ්‍රී ලංකාවේ බේරුවල වෙරළ තීරයේ සිංහල - මුස්ලිම් සංස්කෘතිකාංග පිළිබඳ මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක්

**බී.වී.ඩී.ටී.එල්. දිසානායක**[1]

ප්‍රමුඛ පදඃ සංස්කෘතිකාංග, ඉස්ලාම් දහම, සංස්කෘතික ඒකාබද්ධතාවය, ආර්ථිකය, සමාජීය පිළිවෙත්

## හැඳින්වීම

ආරම්භයේ දී ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ මධ්‍යගතව පිහිටා ඇති දූපතක් වශයෙන් පැවතී ඇති අතර පුරාණ කාලයේ පටන් ම ජාතික හා සංස්කෘතික විවිධත්වයකට යටත් වී ඇති රටක් ලෙස පෙන්වා දිය හැක. මෙවන් සංස්කෘතික සන්ධිස්ථානයක් වන බේරුවල, බටහිර වෙරළ තීරයෙහි පිහිටා ඇති නගරයක් වශයෙන් පෙන්වා දිය හැක. මුස්ලිම් හා සිංහල ජනයාගේ සිරිත් විරිත්වල සමාන ලක්ෂණ නිරූපණය කරන අවස්ථා පවතී ද යන්න මෙහි පර්යේෂණ ගැටළුව වේ. ශ්‍රී ලංකාව බහුවාර්ගික ජන සමාජයක් නියෝජනය කරන අතර එම ජන කොට්ඨාසවලට අනන්‍ය වූ සිරිත් විරිත් නිර්මාණය වී ඇත්තේ එම ජන සමාජයට ආවේණික ලෙස ය. බේරුවල මුස්ලිම් හා සිංහල ජනයාගේ සිරිත් විරිත්වල අසමානතා මෙන් ම සමානකම් ද පවතින අතර සිරිත් විරිත් නිර්මාණයට දේශපාලන, සමාජ, ආර්ථික, ආගමික සහ සංස්කෘතික පසුබිම බලපා ඇති බව හඳුනාගත හැක. සංස්කෘතික ගැටුම් අවම කිරීමට නම්, ඒ ඒ ජනවර්ග සතු සංස්කෘතික අනන්‍යතා හඳුනාගත යුතු බවත් මෙකල සමාජයේ පුද්ගලයාට සිරිත් විරිත් හරහා පණිවිඩයක් ලබාදීමට කටයුතු කර ඇති ආකාරයත් මෙම පර්යේෂණය තුළින් අධ්‍යයනය කර ඇත.

## ක්‍රමවේදය

මුස්ලිම් ජනයාගේ සිරිත් විරිත්වල සමාන ලක්ෂණ නිරූපණය කරන අවස්ථා පවති ද යන පර්යේෂණ ගැටළුව නිරාකරණය කරගැනීම උදෙසා මුස්ලිම් ජනයාගේ සිරිත් විරිත් හා සිංහල ජනයාගේ සිරිත් විරිත් සංසන්දනාත්මක අධ්‍යයනය කළ යුතු ය. මෙහි දී දත්ත සංඛ්‍යාත්මකව ඉදිරිපත් කරනු ලබන අතර ම ගුණාත්මක දත්ත නිරූපණය ද සිදු කරනු ලැබේ. මෙම ක්‍රමවේදයන් දෙක යටතේ ම දත්ත නිරූපණය කරන බැවින් මෙහි පර්යේෂණ ක්‍රමවේදය මිශ්‍ර පර්යේෂණ ක්‍රමය ලෙස පෙන්වා දිය හැක.

---

[1] පුරාවිද්‍යාව හා උරුම කළමණාකරන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, tharushikadissanayake122@gmail.com

ප්‍රතිඵල හා සාකච්ඡාව

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයට අයත් එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයක් ලෙස බේරුවල පෙන්වා දිය හැක. බේරුවල ප්‍රදේශය උතුරු දිගින් කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, නැගෙනහිරින් මතුගම හා දොඩම්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවලින් ද, දකුණින් බෙන්තර ගඟින් ද, බටහිර දිගින් මුහුදු සීමාවෙන් ද මායිම් ව පිහිටා ඇත.

බේරුවල අනෙකුත් ප්‍රදේශවලට වඩා සාපේක්ෂව සුවිශේෂ වන අතර ඊට හේතුව වනුයේ සිංහල, මුස්ලිම් සහ ද්‍රවිඩ ජන සංයුතියෙන් යුක්ත වීමත් බෞද්ධ, ඉස්ලාම් හා කතෝලික ආගමික සංයුතියෙන් යුක්ත වීම හා අතීතයේ සිට ම ධීවර කර්මාන්තය, සංචාරක කර්මාන්තය මුල් කරගනිමින් වාණිජ මධ්‍යස්ථානයක් බවට පත් ව තිබීමයි. මෙම කලාපය ආශ්‍රිත ව ක්‍රියාත්මක වන ප්‍රධාන ආර්ථික කටයුතු වනුයේ ධීවර කර්මාන්තය, කරවල නිෂ්පාදන කර්මාන්තය, සංචාරක කර්මාන්තය, රා නිෂ්පාදන කර්මාන්තය හා වී ගොවිතැන වේ. මුස්ලිම් ජනයා මෙරටට පැමිණ ඇත්තේ සංක්‍රමණික පිරිසක් ලෙස ය. ඈත අතීතයේ සිට පර්සියානු හා අරාබි ජාතිකයෝ වෙළඳාමට රටින් රටට ගියහ. මුහුදු ගමන් මාර්ග ඔස්සේ රුවල් නැව් භාවිත කරමින් වෙළඳාම් කටයුතු කළ ඔවුහු එම රටවල්වල වරාය සිය වෙළඳ මධ්‍යස්ථාන කර ගත්හ. අරාබි ජාතිකයෝ නවවන හා දසවන සියවස්වල ඉන්දියාවේ බටහිර වෙළඳබඩ ප්‍රදේශවල සිය වෙළඳ ගබඩා පවත්වාගෙන ගියහ. අරාබි ජාතිකයෝ ප්‍රධාන මුහුදු මාර්ගය ඔස්සේ පහසුවෙන් ම ශ්‍රී ලංකාවේ නැව් තොටුවලට ළඟා වී එහි ද වෙළඳ ගබඩා පිහිටුවා ගත්හ. මේ ආකාරයට මුස්ලිම් ජනයා ශ්‍රී ලංකාවට සංක්‍රමණය වූ ආකාරය හා බේරුවල ප්‍රදේශයේ ව්‍යාප්ත වූ ආකාරය සාහිත්‍ය කෘති තුළින් දක්වා ඇත. උපත හා බැඳි සිරිත් විරිත්, මල්වර සිරිත් විරිත්, විවාහ සිරිත් විරිත්, පවුල් සංස්ථාව, මරණය හා බැඳි සිරිත් විරිත්, ආහාර ගැනීම සම්බන්ධ සිරිත් විරිත්, ඇදහිලි හා විශ්වාස පද්ධතිය යන අංශ ඔස්සේ මොවුන්ගේ එක් එක් සංස්කෘතිකාංග බැඳි ඇති බව පෙනේ.

මානවයා උපතින් ම සමාජයේ සාමාජිකයෙක් බවට පත් වන නිසා සමාජයේ ජීවත් වීමේ දී ආගමික, දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික අංශ කෙරෙහි බැඳි සිටී. එම අංශවලින් පුද්ගලයාට ඉවත් ව සිටීමට නොහැක. මෙම අංශවල සාර්ථක ලෙස නියැලෙන පුද්ගලයාට සමාජයේ උසස් ස්ථානයක් හිමි වන අතර මානව ගණුදෙනු සිදු කිරීමේ දී මෙම අංශ සමාජයෙන් සමාජයට වෙනස් වන අයුරු දැකිය හැක. ආගමික අංශය ගතහොත් බේරුවල ප්‍රදේශයේ මුස්ලිම් ජනයාගේ ප්‍රධාන ආගම ඉස්ලාම් ආගම වන අතර අදහන පවුල් සංඛ්‍යාව 12802කි. මෙහි සිංහල ජනයාගේ ප්‍රධාන ආගම බෞද්ධ ආගම වේ. එය අදහන පවුල් සංඛ්‍යාව 28804කි. ඒ අනුව මෙම ප්‍රදේශය තුළ බහුතරයක් සිංහල බෞද්ධ ආගමික ජනතාව ජීවත් වුවත් ඊට සාපේක්ෂව සැලකිය යුතු මට්ටමක ඉස්ලාම් ආගමික ජන පිරිසක් සිටින බව පෙනේ. උසස් සමාජයක් බිහි කිරීමට අධ්‍යාපනය අත්‍යවශ්‍ය වේ. ජාති, කුල, ආගම් භේදයකින් තොරව අධ්‍යාපනය සැමට ම පොදු වූ කරුණකි. බේරුවල ප්‍රදේශයේ ජනයාගේ අධ්‍යාපන මට්ටම සලකා බැලීමේ දී පෙනී යන්නේ පුරුෂ

පාර්ශවයට වඩා ස්ත්‍රී පාර්ශවය අධ්‍යාපනය ලැබීමට පෙළඹී ඇති බවය. බේරුවල ප්‍රදේශයේ මුස්ලිම් ප්‍රජාව රැකියාවක නිරත වීමේ දී ප්‍රධාන වශයෙන් සලකනුයේ සලාතය පහසුවෙන් ඉටු කිරීමට හැකි වීමයි. ඒ හේතුව නිසාවෙන් මෙම ප්‍රදේශයේ මුස්ලිම් ජනයා බහුතරයක් වෙළඳාම් කටයුතුවල නිරත වන අතර මැණික් කර්මාන්තයේ ද නිරත වන පිරිස් ද හඳුනාගත හැක. මොවුනගේ සංස්කෘතියේ මූලික අංගයක් ලෙස සංස්කෘතික උත්සව පෙන්වා දිය හැකි අතර රාමසාන් උත්සවය, හජ්ජි උත්සවය මෙහි මූලික තැනක් ගනු ලැබේ.

## සමාලෝචනය

සංස්කෘතික ගැටුම් අවම කිරීමට නම්, ඒ ඒ ජන වර්ග සතු සංස්කෘතික අනන්‍යතා හඳුනාගත යුතුය. බේරුවල මුස්ලිම් ජනයාගේ සංස්කෘතික ලක්ෂණ හඳුනාගැනිම එහිලා වැදගත් වේ. අනාගත පරම්පරාවට තම ජීවන රටාව නිවැරදි ආකාරයෙන් හැඩගස්වා ගැනීමටත්, ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු මෙරට සිටින අනෙක් ජනවර්ග සමඟ සියවස් ගණනක් තිස්සේ ඉතා සාමකාමී ව සහ සමඟියෙන් ජීවත් ව ඇති බව දැන්වීමටත්, සාමකාමී සහජීවනය පිළිබඳ අනාගත පරපුර දැනුවත් කිරීමෙන් සහජීවනය වඩා ශක්තිමත් කර ගැනීම පර්යේෂණයේ අරමුණ වේ.

## ආශ්‍රිත මූලාශ්‍ර

සේනාරත්න, පී.ඇම්. (1999). ***ශ්‍රී ලංකාවේ විවාහ චාරිත්‍ර***. සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සමාගම.

විජේසිංහ, සෝමරත්න. (1964). ***ලංකාවේ යුරෝපීය ජාතිහු.*** ශ්‍රී ලංකා ප්‍රකාශන සමාගම.